// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1875/33 - 2014 අගෝස්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2014.08.14
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) වැනි අනු ව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති 1681/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2014 අගෝස්තු මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍ය (අංක 58) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 3 වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-

"4. අඩු ආදායම්ලාභී, අවම පහසුකම් නොමැති නිවාසවල ජීවත්වන ජනතාවගේ සුබසාධන තත්ත්වය නගාසිටුවීම සඳහා අවශ්‍ය සැළසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම" ;

(2) එම නිවේදනයෙහි උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍ය (අංක 67) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි 3 වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-

"4. අපේ ගම" ;

08 - 1020

1A - G 20063 — 355 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*